රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 13/94

මගේ අංකය :- V/01/06/01
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994 අප්‍රියෙල් මස 26 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ සේවකයන්ගේ සුභසාධක හා ක්‍රීඩා කටයුතු සංවිධානය කිරීම.

රජයේ සේවකයන්ගේ කායික හා මානසික ක්‍රියාශීලීත්වය ක්‍රීඩා සහ විනෝදමය කටයුතු තුලින් වැඩි දියුණු කිරීමේ වැදගත්කම ගරු රාජ්‍ය පරිපාලන ඇමතිතුමා විසින් අවධාරණය කර ඇත. රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රීඩා සංවිධාන ක්‍රියාශීලි කිරීමේ අරමුනින් පහත දැක්වෙන පරිදි සංවිධාන පද්ධතියක් ඇති කරනු ඇත.

02.
1. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/කාර්යාල මට්ටමේ ක්‍රීඩා සමාජ පිහිටුවීම.
2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඇති එම ක්‍රීඩා සමාජ එක්කොට ප්‍රාදේශීය ක්‍රීඩා සමිති පිහිටුවීම.
3. දිස්ත්‍රික් ක්‍රීඩා සමිති පිහිටුවීම: ප්‍රාදේශීය ක්‍රීඩා සමිති නියෝජිතයින් අතුරෙන් තෝරා පත් කර ගනු ලැබේ.
4. පළාත් ක්‍රීඩා සමිති පිහිටුවීම: දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් නියෝජිතයින් අතුරෙන් තෝරා පත් කරරගනු ලැබේ.
5. ජාතික මට්ටමේ රාජ්‍ය සේවා ක්‍රීඩා සමිති පිහිටුවීම: දිස්ත්‍රික්/පළාත් ක්‍රීඩා සංවිධාන නියෝජනය වීමෙනි.

03. මෙම ක්‍රීඩා සමාජ/සමිතිවල සංවිධායකවරුන් පහත දැක්වෙන පරිදි විය යුතුය.

| | | |
|---|---|---|
| I. | රාජ්‍ය සේවා ක්‍රීඩා සමාජ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ කාර්යාල | සංවිධායක ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා ආයතන ප්‍රධානියා හෝ බලයලත් නිලධාරී. |
| II. | ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය සේවා ක්‍රීඩා සංගම්/සමිති | ප්‍රාදේශීය ලේකම් |
| III. | දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය සේවා ක්‍රීඩා සංවිධාන කමිටු/සමිති | දිස්ත්‍රික් ලේකම් |
| IV. | පළාත් මට්ටමේ රාජ්‍ය සේවා සංගම්/සමිති | ප්‍රධාන ලේකම් |
| V. | ජාතික මට්ටමේ රාජ්‍ය සේවා ක්‍රීඩා සමිති | රාජ්‍ය පරිපාලන ලේකම් |

04. සංවිධායකවරුන් තමාට නියමිත ක්‍රීඩා සමාජ/සංගම් ආරම්භ කිරීමට මග පෙන්වීමක් කළ යුතුය.

05. ක්‍රීඩා කටයුතු හා සුභ සාධක කටයුතු වලදී සියළු රජයේ සේවකයින්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ලබා ගැනීම පිණිස හා මෙම කටයුතු සම්බන්ධීකරණය සඳහා සංවිධායකවරුන්ගේ පෞද්ගලික අවධානය යොමු කිරීම අතිශයින් අවශ්‍ය වේ. ඒ සඳහා කළ යුතු ක්‍රියාකාරකම් සමහරක් පහත පලවේ.

1. ක්‍රීඩා සමාජ හා අන්තර් ක්‍රීඩා සමාජ අතර තරග පැවැත්වීම සඳහා වැඩසටහන් පිළියෙල කිරීම.

2. ක්‍රීඩා හා සුභ සාධක කටයුතු සඳහා මුදල් රැස්කිරීම.

3. ක්‍රීඩා හා සුභසාධක කටයුතු පිළිබඳව වාර්ෂික සැළසුම් සකස් කිරීම.

4. මෙම කටයුතු සඳහා අවශ්‍ය ප්‍රචාරය ලබා දීම.

06. ක්‍රීඩා සමාජ හා ප්‍රාදේශීය ක්‍රීඩා සංගම් පිහිටුවීම පිළිබඳව උපදෙස් 'ඒ' ඇමුණුමේ සඳහන් වන අතර, ප්‍රාදේශීය ක්‍රීඩා සංගම් පිහිටුවීමට අදාළ කර ගත හැකි ව්‍යවස්ථා කෙටුම්පතක ආදර්ශයක් 'බී' සහ 'සී' ඇමුණුම් ලෙස යා කර ඇත.

6.1 නිසි ලෙස පිහිටුවන ක්‍රීඩා සමාජ හා සංගම් වල නාමලේඛණයන් මෙම අමාත්‍යාංශයේ පවත්වා ගෙන යනු ඇත.

6.2. බොහෝ කාර්යාලවල දැනටමත් සංවිධානය වි ඇති ක්‍රීඩා සමාජ හා සුභසාධන සංගම් නව වැඩපිළිවෙළ මත තවදුරටත් විධිමත් කළ හැකි අතර, රාජ්‍ය සේවකයින්ගේ සුභසාධන අවශ්‍යතාවයන් ඉටු කරන අතරම, ක්‍රීඩාලෝලී පිරිසක් බිහි කිරීමටටත් මෙම වැඩපිළිවෙල තුලින් හැකියාවක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

07. ක්‍රීඩා සමිති පිහිටුවීම පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත ක්‍රීඩා නිලධාරීන්ගේ
සහයෝගය මේ සඳහා ලබා ගත හැකිය.

08. මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට සුභසාධක කටයුතු සඳහා වෙන්වූ ප්‍රතිපාදන වලින්
මුදල් ලබා දිමට අපේක්ෂා කරන අතර, එම මුදල් වැය කළ හැකි ආකාරය පැහැදිලි කර එවනු ලැබේ.

09. රාජ්‍ය සේවා ක්‍රීඩා සමිතිවල ගිණුම්, සංවිධායක විසින් හෝ සංවිධායක විසින් බලය පවරන
නියෝජිතයා විසින් පරීක්ෂා කර බැලිය යුතු අතර, පිළිගත් විගණකවරයකු හෝ රජයේ ගණකාධිකාරීවරයකු හෝ විගණන අධිකාරීවරයකු විසින් වාර්ෂික ගිණුම් ප්‍රකාශන සහතික කළ යුතු වේ.

10. ප්‍රාදේශීය/දිස්ත්‍රික් ක්‍රීඩා සමිතිවල ගිණුම් ද ඉහත කී අන්දමට සහතික කර ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් විසින් ලබා ගත යුතුය. ලබා දුන් මුදල් නිසි පරිදි ගිණුම් ගත කර තිබේදැයි සංවිධායකවරු පරීක්ෂා කර සෑහීමකට පත්විය යුතුය.

11. නිසි පරිදි විගණනය කළ ගිණුම් ප්‍රකාශන සෑම සමිතියක් විසින්ම මුදල් වර්ෂය (ලිත් වර්ෂය) අවසන් වී මාස 03 ක් ඇතුළත සංවිධායක වෙත ඉදිරිපත් කළ යුතුය.

ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ ගිණුම් පිළිබඳ විගණනයේදී ප්‍රශ්න කරනු ලැබූ ක්‍රීඩා සමිති, නිසි පරිදි යථා තත්ත්වයට පත්වන තුරු යම් කාලසීමාවකට මුදල් වෙන්කර දෙනු නොලැබේ.

12. විස්තර එවීමට ඇති ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ක්‍රීඩා සමාජ විස්තර හා වැඩ සටහන් අප්‍රමාදව
මා වෙත එවිය යුතු බව දන්වමි.

.(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

පිටපත් :
1. විගණකාධිපති - දැ.ස.
2. ලේකම්, ස්වදේශ කටයුතු හා පළාත් සභා අමාත්‍යාංශය - දැ.ස.
මෙම වැඩ පිළිවෙල සාර්ථක කරගැනීම සඳහා ඔබ අමාත්‍යාංශයේ කාරුණික සහාය ලබාදීම පිණිස හා දැ.ස.
3. සියලුම පළාත් සභා ලේකම්වරුන් වෙත ) - දැන ගැනීම
4. පළාත් සභා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ) සඳහා හා
අවශ්‍ය සහාය ලබා දීමට.

13/94

ඇමුණුම 'ඒ'

# රාජ්‍ය සේවා ක්‍රීඩා සමාජ සංවිධාන

## 01. සංවිධානය කිරීම සඳහා උපදෙස් :-

රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා ක්‍රීඩා සංවිධාන පිහිටුවන මෙන් ඉල්ලා සිටීම පිණිස ප්‍රාදේශීය කාර්යාලවල, ආයතන.නවල ප්‍රධානීන්ගේ/නියෝජිතයින්ගේ රැස්වීමක් පැවැත්විය යුතුය. ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී දෙපාර්තමේන්තු කිහිපයක රජයේ නිලධාරීන් එක් වී ක්‍රීඩා සමාජයක් පිහිටුවා ගත හැකිය.

(ක්‍රීඩා සමාජ 1994.06.30 දිනට පෙර පිහිටුවිය යුතුය.) ක්‍රීඩා සංවිධානවල කටයුතු සමතාවයකින් යුතුව ක්‍රියාත්මක වීම අවශ්‍ය නිසා ආදර්ශ ව්‍යවස්ථා කෙටුම්පතක් මේ සමග ඇත. අවශ්‍ය සංශෝධන කර ගත හැකිය. ආරම්භක රැස්වීමේ වාර්තාව, සංගමය පිළිගත් ව්‍යවස්ථාවේ පිටපත, නිලධාරීන්ගේ නාමලේඛණය අප වෙත එවන්න.

## 02. රාජ්‍ය සේවා ප්‍රාදේශීය ක්‍රීඩා සමිති සංවිධානය කිරීම :-

ක්‍රීඩා සමාජ ආරම්භ කළ පසු 1994.07.31 ට ප්‍රාදේශීය ක්‍රීඩා සංගම් පිහිටුවීම සඳහා ක්‍රීඩා සමාජවල නියෝජිතයින් කැඳවි යුතුය. කෙටුම්පත් ව්‍යවස්ථාවක් මේ සමග ඇත. ප්‍රාදේශීය ක්‍රීඩා නිලධාරීන්/ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්/පොලිස් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැනි ආයතන වල සුදුසුකම් ලත් නිලධාරීන්, සුදුසුකම් හා පළපුරුදු රජයේ විශ්‍රාමිකයන් සමිතියේ කටයුතු සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වීමට උනන්දු කළ හැකිය. ආරම්භක රැස්වීමේ වාර්තාව, සංගමය පිළිගත් ව්‍යවස්ථාවේ පිටපත, නිලධාරීන්ගේ නාම ලේ'ණය ප්‍රාදේශීය ලේකම් විසින් 1994.08.31 ට පෙර රා.පරි.ලේ.වෙත එවිය යුතුය.

## 03. කාර්ය වැඩසටහන :-

ප්‍රාථමික මට්ටමේ ක්‍රීඩා සමාජවල නිලධාරීන්/සාමාජිකයින්ගේ අදහස් අනුව සංවිධානය කල යුතු ක්‍රීඩා සහ විනෝද කටයුතු තීරණය කළ හැකිය. ඒවාට සහභාගී වීමන පිණිස නිලධාරීන්ගේ හා විශ්‍රාමිකයන්ගේ පවුල් වල සාමාජිකයින් උනන්දු කළ හැකිය. <u>කෙසේ වුවද දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටම්වල දී රාජ්‍ය සේවා ක්‍රීඩා තරග නියෝජනය කළ හැක්කේ සේවයේ යෙදී සිටින රජයේ නිලධාරීන්ට පමණකි.</u>

වයස අවුරුදු **35** ට වැඩි කාන්තා හා වයස අවුරුදු **40** ට වැඩි පිරිමි තරග සංවිධානයේ දී කණ්ඩායම් වයස් සීමාවේ වසර **05** ක පරාසය තුළ නියම කළ යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| උදා:- | අවුරුදු **35** | - | **39** | |
| | | **40** | - | **44** |
| | | **45** | - | **49** වශයෙනි. |

ප්‍රාදේශීය මට්ටමේ තරග අප්‍රියෙල් මසදීද/පළාත් මට්ටමේ තරග අගෝස්තු මාසයේදී ද සංවිධානය කළ යුතු අතර, ඉන් පසු ජාතික මට්ටමේ තරග පැවැත්වෙනු ඇත.

04. <u>මුදල්:-</u>

ක්‍රීඩා වැඩසටහන් ආරම්භ කිරීම සඳහා දැනට අරමුදල් වෙන් කර නොමැති ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල ක්‍රීඩා සමාජ සඳහා සුභසාධක වැය ශීර්ෂය යටතේ රුපියල් 1500/- ක මුදලක් වෙන් කර දීම ගරු රාජ්‍ය පරිපාලන ඇමතිතුමා විසින් අනුමත කර ඇත. ක්‍රීඩා සමාජ ආරම්භ කල පසු මෙම අරමුදල් ලබා දෙනු ඇත. අවශ්‍ය පරිදි ප්‍රාදේශීය මට්ටම් අරමුදල් රැස් කර ගැනීමට හැකියාව තිබේ.

රාජ්‍ය සේවා/දිස්ත්‍රික් ක්‍රීඩා සංවිධාන සඳහා රජයේ අරමුදල් වෙන් කිරීම එම සංගම් ආරම්භ කිරීමෙන් පසුව සලකා බලනු ඇත.

05. <u>ද්‍රව්‍ය හා අතිකුත් පහසුකම් :-</u>

රජයේ ආයතන වල විවිධ සම්පත් ජනතා අවශ්‍යතා පරිදදි පරිහරණය කිරීමේ පහසුකම් ලබාදිය යුතු යැයි පිළිගෙන ඇත. මේ ප්‍රතිපත්ති තීරණ අනුව ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු වලට සහභාගි වීම සඳහා රජයේ නිලධාරින්ට ඔවුන්ගේ පවුල්වල අයට සහ විශ්‍රාමිකයන්ට හැකි හැම අවස්ථාවලදී පාසැල් වැනි රජයේ ආයතනවල පවත්නා පහසුකම් ලබා දිය හැකිය. ප්‍රාදේශීය ලේකම්වරුන් එවැනි පහසුකම් ලබා දිය හැකි ස්ථාන පිළිබඳ ලේඛණයක් ග්‍රාමනිලධාරි මාර්ගයෙන් සකස් කර ගත හැකි අතර, එම පහසුකම් ප්‍රාදේශීය ක්‍රීඩා සමාජවලට ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත.

06. <u>ජනමාධ්‍යය :-</u>

සියලුම රජයේ සේවකයින් ක්‍රියාකාරී ලෙස මෙම ක්‍රීඩා හා විනෝදාත්මක වැඩසටහන් වලට සහභාගී වීමට උනන්දු කරලීම සඳහා සහ රජයේ නිලධාරින්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, විශ්‍රාමිකයින් ක්‍රීඩාවන්හි ක්‍රියාකාරී ලෙස සහභාගී කර ගැනීමට හැකි වන සේ මෙම ක්‍රීඩා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය නියෝජිතයින් මගින් ප්‍රසිද්ධියක් ලබා දිය හැකිය.

රාජ්‍ය සේවයේදී සාර්ථකව කටයුතු කිරීම සඳහා ක්‍රීඩාවේ අගය පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

ඇමුණුම් ‘බී’

.................................................................

<u>ක්‍රීඩා සමාජයේ ව්‍යවස්ථාව</u>

(01) නාමය :-

මෙම ක්‍රීඩා සමාජයේ නම:- .......................................................................
ක්‍රීඩා සමාජය යනුවෙන් හැඳින්වේ. - (මින් ඉදිරියට සමාජය යනුවෙන් හැඳින්වේ).

(02) ලිපිනය :-

සමාජයේ ලියාපදිංචි ලිපිනය වන්නේ ....................................................................
.................................................................................................. යන්නය.

(03) පරමාර්ථ :-

(I). <u>ක්‍රීඩාවන්ට සහභාගි වීම.</u>

මින් රජයේ නිලධාරීන්ගේත්, විශ්‍රාමිකයන්ගේත් ඔවුන්ගේ දරු පවුල්වලත් ශාරීරික සහ මානසික සෞඛ්‍ය වර්ධනය කරන අතර, ක්‍රීඩා හැකියාවන් වැඩි දියුණු කිරීමෙහිලා ඔවුන් උනන්දු කරවීම.

(II). අනිකුත් ක්‍රීඩා සමාජ හා මෙම සමාජය අතර සහයෝගය ගොඩ නගා ගැනීම.

(III). සමාජයේ සාමාජිකයන්ගේ ක්‍රීඩා කෞශල්‍යය සඳහා ආධාර ලබා දීම.

(IV) ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩා කණ්ඩායම් සංවිධානය කිරීම.

(V). ක්‍රීඩා සංවිධායක, පුහුණුකරු හා නිලධාරීන් සඳහා පාඨමාලා සංවිධානය කිරීම.

(VI). සමාජයේ අවශ්‍යතාවය සඳහා වන චංචල හා නිශ්චල දේපළ මිලට ගැනීමේත්, බද්දට ගැනීමේත්, තෑගි ලැබීමේත්, අත්පත් කර කර ගැනීමේත් හා චංචල දේපළ පමණක් අවශ්‍ය විට විකිණීමට කටයුතු කිරීම.

(VII). සමාජයේ අවශ්‍යතාවන් සඳහා අනිකුත් ආයතනයන්ගෙන් හා සමාජයෙන් ප්‍රදානය කරන ණය හා අනිකුත් මූල්‍යමය ආධාර ලබා ගැනීම.

(04) සාමාජිකත්වය:-

සමාජයේ සාමාජිකත්වය රාජ්‍ය දෙපාර්තමේන්තු ආයතනවල නිලධාරීන්ටත්, විශ්‍රාමිකයන්ටත් විවෘතව ඇත. ඔවුන්ගේ සාමාජිකත්වය සාමාජික මුදල් සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් හා සාමාජික විධායක කමිටුවේ අනුමත වීම මත රඳා පවතී. සාමාජිකයන්ට වාර්ෂික මහා සභා රැස්වීමේදී එක් ඡන්දයක් පමණක් පාවිච්චි කළ හැකිය. සාමාජිකත්වය සඳහා අයදුම් කළ හැක්කේ ඒ සඳහා වන අයදුම්පත්‍රය සම්පූර්ණ කර අදාල ගාස්තු ගෙවීමෙන් පසුවය.

(05) ගාස්තු :-

සියළුම සාමාජිකයන් විසින් රු........................................ ක වාර්ෂික සාමාජික මුදලක් සාමාජිකත්වය ලබා ගැනීමේ දි ගෙවිය යුතුය. මෙය මාසිකව රු.................. බැගින් ගෙවිය හැක.

(06) මුදල් වර්ෂය :-

සමාජයේ මුදල් වර්ෂය ජනවාරි 01 දින සිට දෙසැම්බර් මස 31 ද අතර වේ.

(07) විධායක කමිටු :-

(අ) සමාජයේ විධායක කමිටුවට පහත සඳහන් නිලධාරීහු අයත් වෙති. සභාපති, උප සභාපතිවරුන් 03 යි, ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික, සටහන්කරු, කමිටු සාමාජිකයින් 10 යි.

(ආ) ඉහත සඳහන් නිලධාරින්ට අමතරව විගණකවරුන් දෙදෙනෙකු සාමාජිකත්වයට පිටතින් තෝරා ගනු ලැබේ.

(ඇ) සියළුම නිලධාරින් පත් කර ගනු ලබන්නේ වාර්ෂික මහා මහා රැස්වීමේදී ය. අඛණ්ඩව වර්ෂ 03 ක් නිල කාලය දැරීමට නිලධාරින්ට හිමිකම් ඇත. වාර්ෂික මහා සභා රැස්වීම් දෙකක් අතර, තනතුරු වල ඇති වන පුරප්පාඩු, සාමාජිකයින් අතුරින් තෝරා පත් කර ගනු ලබන අතර, එසේ කිරීමේ බලය විධායක කමිටුවට ඇත.

(08) අනුශාසක මණ්ඩලය :-

ප්‍රධාන අනුශාසක සහ උප අනුශාසකවරුන් තිදෙනෙක් වාර්ෂික මහා සභා රැස්වීමේ දී පත් කළ යුතුය.

(09) රැස්වීම :-

(අ) වාර්ෂික මහා සභා රැස්වීම මුදල් වර්ෂය අවසානව මාස 03 ක් ඇතුළත පැවැත්විය යුතුය.

(1) පෙර වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කිරීම සහ සම්මත කිරීම.
(2) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.
(3) වාර්ෂික ගිණුම් ප්‍රකාශනය හා ශේෂ පත්‍රය ඉදිරිපත් කිරීම හා සම්මත කිරීම.
(4) විධායක කමිටුවට හා අනිකුත් කමිටුවලට සාමාජිකයින් පත් කිරීම.
(5) විගණනවරුන් පත් කිරීම.
(6) අනුශාසක සහ උප අනුශාසකවරුන් පත් කිරීම.

(ආ) විධායක කමිටු රුස්වීම :-

විධායක කමිටුව මාසයකට වරක් රුස්විය යුතු අතර, සමාජයේ එදිනෙද කටයුතු පිලිබඳව වගකීම් දැරිය යුතුය. සෑම අංශයකින් ම සාමාජකයින් වර්ධනය කිරීම සඳහා මෙහි විධිවිධානයන් සලසා දීම සම්බන්ධයෙන් විධායක කමිටුව සාමූහිකව වගකීම දැරිය යුතුය.

(ඇ) අනු කමිටුව :-

විධායක කමිටුව විසින් අනුකමිටු පත් කළ හැකි අතර, මේ සඳහා සාමාජිකයන්ගෙන් අනු කමිටු සාමාජිකත්වය සමන්විත විය යුතුය. එසේම එක් එක් ක්‍රීඩාවන් සඳහා අනුකමිටුවක් තිබිය යුතුය.

(10) රුස්වීම් පැවැත්වීම :-

(අ) වාර්ෂික මහා සභා රුස්වීම පවත්වනු ලබන ස්ථානය සහ දිනය විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

(ආ) ඉදිරි විධායක කමිටුව හා අනු කමිටු පවත්වන ස්ථානයන් දිනයන් ඒ එක් එක් කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සෑම රුස්වීමකම ඝන පූරණය අදළ මුළු සාමාජකත්වයෙන් සියයට තිහ (30%) කට වැඩිවිය යුතුය.

(ඈ) විධායක කමිටු තීරණ අනුව හෝ සාමාජකත්වයෙන් 1/3 ක සාමාජකත්වය විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත හෝ විශේෂ මහා සභා රුස්වීමක් කැඳවිය යුතුය. මෙම ඉල්ලීම් මහා සභා රුස්වීමට යෝජිත දිනයට සතියකට පෙර විධායක කමිටු ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඉ) වාර්ෂික මහා සභා රුස්වීමට යටත් පිරිසෙයින් එක් මාසයක කාලයක් දිය යුතු අතර, අනිකුත් රුස්වීම් සඳහා ද සතියක කාලයක් දිය යුතුය.

(11) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම:

මෙම ව්‍යවස්ථාවෙහි අඩංගු කිසියම් වගන්තියක් හෝ වගන්ති කිහිපයක් සාමාජකයන් විසින් අනුමත කොට යෝජනා සම්මත කිරීමෙන් සංශෝධනය කළ හැක. සාමාජකයින් විසින් කිසියම් සංශෝධනයක් කරන්නේ නම් වාර්ෂික මහා සභා රුස්වීමේ හෝ අදල වන තැන්හි විශේෂ මහා සභා රුස්වීමක් පවත්වා, වෙනස් කිරීම් ඉදිරිපත් කළ යුතුය. ව්‍යවස්ථාවට අදළ නැති කරුණු සම්බන්ධව පැන නගින කරුණු සබන්ධව තීරණය ගැනීම සඳහා විධායක කමිටුවට බලය පැවරේ.

/..6

<u>ප්‍රාදේශීය රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයේ ව්‍යවස්ථාව</u>

01. නාමය :- මෙම ක්‍රීඩා සංගමයේ නම ............................................................ ප්‍රාදේශීය රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය වේ. (මින් ඉදිරියට සංගමය යනුවෙන් හැඳින්වේ)

02. ලිපිනය :- සංගමයේ ලියාපදිංචි ලිපිනය වන්නේ දැනට සංගමය පවත්නා ස්ථානයේ ලිපිනයයි.

03. පරමාර්ථය :-

(1) රජයේ නිලධාරින් හා ඔවුන්ගේ දරු පවුල්වලත් අය ද ක්‍රීඩාවට සහභාගී කරවා ශාරීරික සහ මානසික සෞඛ්‍ය වර්ධනය කරලීම.

(2) ...................................... දිස්ත්‍රික් රාජ්‍ය සේවා ක්‍රීඩා සංගම් සහ අනිකුත් ක්‍රීඩා සංගම් සමග අන්‍යෝන්‍ය සබඳතාවය වර්ධනය කිරීම.

(3) දිස්ත්‍රික් හා ඉහළ තලයන්හි ක්‍රීඩා තරග සඳහා සමාජයේ සියළුම සාමාජිකයන්ගේ උනන්දුව වර්ධනය කිරීම.

(4) ප්‍රාදේශීය මට්ටමේ තරගකාරී හා තරගකාරී නොවන ක්‍රීඩා සංවිධානය කොට දිස්ත්‍රික් පළාත් සහ ජාතික මට්ටමේ තරග වලට ද ඔවුන් සහභාගී කරවීම.

(5) ඉහත සඳහන් තරග සඳහා කණ්ඩායම් සංවිධානය සහ පුහුණු කිරීම.

(6) ක්‍රීඩා තරග සංවිධායකයන් ක්‍රීඩා උපදේශකවරුන්, පුහුණුකරුවන් සහ ක්‍රීඩා නිලධාරින් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.

(7) ක්‍රීඩාවේ සහ සාමාජිකයන්ගේ උන්නතිය තකා සමාන ක්‍රීඩා සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

(8) සංගමයේ අවශ්‍යතාවය සඳහා චංචල හෝ නිශ්චල දේපළ මිළදී ගැනීම්, බද්දට ගැනීම, ත්‍යාග ලෙස තබා ගැනීම හෝ වෙනත් ආකාරයකට අත්පත් කර ගැනීම සහ ඉහත කී පරිදි විකිණීමෙන්, බදු දීමෙන් උගස් කිරීමෙන් හෝ වෙනත් අයුරකින් බැහැර කිරීම.

(9) වෙනත් ආයතන වලින්/සමාජ වලින් මෙම සමාජයේ අරමුණු සඳහා මූල්‍ය ආධාර, දිමනා ලබා ගැනීම.

04. සාමාජිකත්වය :-

සංගමයේ සාමාජිකත්වය ප්‍රාදේශීය රාජ්‍ය සේවයේ ක්‍රීඩා සමාජ වලට විවෘතව ඇත. ඔවුන්ගේ සාමාජිකත්වය සාමාජික මුදල් සම්පූර්ණයෙන් ගෙවීමෙන් පසුව විධායක කමිටුවේ අනුමත වීම මත රඳා පවතී. සෑම සමාජයකටම වාර්ෂික සහ සභා රැස්වීමේදී එක් ඡන්දයකට හිමිකම් ලබයි.

වාර්ෂික මහා සභා රැස්වීමක් සාමාජිකයන් 10 කට නොඅඩු සංඛ්‍යාවකගෙන් සමන්විත විය යුතුය. සාමාජික අයඳුම්පත් නියමිත පෝර්මයක් මගින් සාමාජික මුදල් ද සමඟ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. අයඳුම්පත සංගමයේ සභාපති සහ ලේකම් විසින් අත්සන් කර තිබිය යුතුය.

05. මූල්‍යය :-

සියළුම සංගම් වාර්ෂික දයක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල වරින් වර වාර්ෂික සමහා සභා රැස්වීමකදි තීරණය විය යුතුය.

මූල්‍ය වර්ෂය ජනවාරි පළමුවැනි දින ආරම්භ වී මීළග දෙසැම්බර් 31 දිනයෙන් අවසන් විය යුතුය. දයක මුදල් ඊළග වර්ෂයේ ජනවාරි 01 දින හෝ එයට පෙර ගෙවිය යුතුය.

06. ඉල්ලා අස්වීම් සහ ඉවත් කිරීම් :-

මේ සාමාජිකයෙක් හෝ සංගමයක් සමාජයෙන් ඉල්ලා අස්වීමට අපේක්ෂා කරන්නේ නම් අවසාන සමාජික මුදල් ගෙවූ වර්ෂයේ දෙසැ. 31 දිනට පෙර එය සමාජයේ ලේකම්ට දැන්විය යුතුය. නැතහොත් එම සංගමය මීළඟ වර්ෂය සඳහා ද දයක මුදල් ගෙවීමට යටත්විය යුතුය. සමාජයේ නිතිරීති වලට පටහැනිවීම හෝ නුසුදුසු හැසිරීම මත සාමාජිකත්වය අහිමි කළ හැක.

07. අනුශාසක හා උප අනුශාසක

සමාජයට අනුශාසක වරයෙක් හා උප අනුශාසකවරුන් තිදෙනෙක් විය යුතු අතර, ඔවුන් වාර්ෂික සභා සභා රැස්වීමේදී ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් අතුරින් පත්විය යුතුය.

08. නිලධාරි මණ්ඩලය :-

සමාජයේ නිලධාරින් මණ්ඩලය මෙසේ විය යුතුය.

සභාපති
උප සභපතිවරුන් 3
ලේකම්
සහකාර ලේකම්
භාණ්ඩාගාරික
සහකාර භාණ්ඩාගාරික
වාර්තා තබන්නා
කමිටු සාමාජිකයන් 10

නිලධාරින් සහ කමිටු සාමාජිකයන් වාර්ෂික සභා සභා රැස්වීමේදී තෝරා ගත යුතුය. එකම තනතුරට උපරිම වශයෙන් වසර 3 කට යළි තෝරා පත් විය හැකි අතර, යළිත් වසරක කාලයකින් පසුව එම තනතුරටම යළි පත්වීමට හැකි විය යුතුය.

යම් නිලධාරිවරයෙකුගේ හෝ කමිටු සාමාජිකයන්ගේ ඇතිවන පුරප්පාඩුවක් විධයාක කමිටුවේ අභිප්‍රාය පරිදි සම්පූර්ණ කළ හැකිය.

**09.** වාර්ෂික සහා සභාව :-

මුදල් වර්ෂව අවසානව මාස **02** ක් ඇතුළත වාර්ෂික මහා සභාව පැවැත්විය යුතුය. එසේම,

(1) පසුගිය වාර්ෂික මහා සභාවේ සහා වාර්තාව ඉදිරිපත් කොට අනුමත කිරීම.
(2) වාර්ෂික වාර්තාව සම්මත කිරීම.
(3) දෙසැම්බර් **31** ත් අවසන් වූ පසුගිය වසරේ වාර්ෂික ගිණුම් ප්‍රකාශය හා ශේෂ පත්‍රය සම්මත කිරීම.
(4) විධායක කමිටුව පත් කිරීම සහ කාලයෙන් කාලයට අවශ්‍ය වන උපකමිටු පත් කිරීම.
(5) විගණකවරුන් පත් තිරීම.
(6) අනුශාසකවරුන් හා උප අනුශාසකවරුන් තෝරා ගැනීම.

**10.** විශේෂ මහා සභා රුස්වීම්:-

විශේෂයෙන් කරන ලද ඉල්ලීමක් පමණක් සලකා බැලීම සඳහා සාමාජික සංගම් සංඛ්‍යාවෙන් **1/3** කට නොඅඩු සංඛ්‍යාවක් විසින් කරන ලද ඉල්ලීමක් වේ නම් විශේෂ මහා සභාවක් කැඳවිය යුතුය. එසේ ඉල්ලීමක් කළ දින සිට ලිත් මාසයක් ඇතුළත සභා රැස්වීම කැඳවිය යුතු අතර, එකී කරුණට පරිබාහිර ද එම රැස්වීමේදී සාකච්ඡා නොකළ යුතුය.

**11.** විධායක කමිටු රුස්වීම් :-

විධායක කමිටුව යටත් පිරිසෙයින් මාසකට වරක්වත් රුස්විය යුතු අතර, සමාජයේ එදිනෙද කටයුතු කර ගෙන යාම පිළිබඳව වගකිය යුතුය.

සැම අංශයකින්ම සමාජයේ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීමෙහි ද වැඩි දියුණු කිරීම ද සහතික වන විධාන පැනවීමෙහිලා විධායක කමිටුව සාමූහිකව වගකිය යුතුය.

**12.** අනුකමිටු:-

විධායක කමිටුව විසින් අවශ්‍ය විට කමිටුවේද සාමාජිකයන් ගෙන් යුත් අනුකමිටු පත් කිරීමටද සාමාජික සංගම් නියෝජිතයන් ලෙස නම් කිරීම ද කළ යුතුය.

**13.** රුස්වීම් පැවැත්වීම :-

වාර්ෂික මහා සභාව පැවැත්වෙන ස්ථානය හා දිනය විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබිය යුතුය. විධායක කමිටුවේ හා අනු කමිටුවල මීළඟ රුස්වීම් දිනය හා ස්ථානය ද විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබි යුතුය. සැම රුස්වීමකම ගණ පූරණය කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාවෙන් **30%** හා තවත් එක් අයෙක් විය යුතුව.

රැස්වීමේ දැන්වීම හා න්‍යාය පත්‍රය සාමාජිකයන්ගේ දැන ගැනීමට සැලැස්විය යුතුය. වාර්ෂික මහා සභා රැස්වීමේදී නම් එම දැනුම් දීම මසකට පෙර කළ යුතුය. අනික් රැස්වීම් වලදී යටත් පිරිසෙයින් රැස්වීමට දෙසතියකට පෙර දැනුම් දිස කල යුතුය.

14. ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම/ව්‍යවස්ථාව සංශෝධනය කිරීම :-

මෙම ව්‍යවස්ථාව සමාජය ආරම්භ වීමත් සමග ක්‍රියාත්මක වන්නේය.

මෙම ව්‍යවස්ථාවේ අඩංගු කිසියම් වගන්තියක්, වගන්තියකින් කොටසක්, රීතියක් හෝ අනු නීතියක් ඉවත් කිරීම, සංශෝධනය කිරීම හෝ අළුතින් හඳුන්වා දුන් වගන්තියක්, අනුරීතියක් හෝ රීතියක් වාර්ෂික මහා සභා රැස්වීමට හෝ ව්‍යවස්ථා සංශෝධනයට රැස්වූ විශේෂ මහා සභා රැස්වීමට සහභාගී වූ මුළු සාමාජික සංඛ්‍යාවෙන් ඡන්දය දීමට සුදුසුකම් ලත් අයගෙන් තුනෙන් දෙකකට නොඅඩු වැඩි ඡන්ද සංඛ්‍යාවකින් අනුමත විය යුතුය.

යම් කරුණක් පිළිබඳව විශේෂිත විධිවිධානයක් නොමැති නම් විධායක කමිටුවේ තීරණය වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ ව්‍යවස්ථා සංශෝධනය සඳහා විශේෂයෙන් කැඳවන ලද සභා රැස්වීමක දී සංශෝධනය කරන තුරු අවසන් තීරණය විය යුතු අතර, තීරණාත්මක ද විය යුතුය.